කොළඹ විශ්වවිද්‍යාලය

ශාස්ත්‍ර පීඨය

ශාස්ත්‍රවේදී තෙවන වසර පරීක්ෂණය - දෙවන සෙමෙස්තරය - 2017/2018

**INR 3247 - මැදිහත්වීම, මැදිහත්කරණය සහ සහමත්‍රණය හැඳින්වීම**

**කාලය පැ දෙකයි (02)**

ප්‍රශ්න **තුනකට (03)** පමණක් පිළිතුරු සපයන්න

---

1. තුෂ්ණී යුද්ධ සමය අවසානයෙන් පසු ගැටුම් නිරාකරණ මෙවලම් සීඝ්‍රයෙන් ක්‍රමිකව විකාශනය වී තිබේ. ගැටුම් නිරාකරණ විෂය හදාරන ශිෂ්‍යයෙකු ලෙස නූතන ගැටුම් නිරාකරණය සඳහා මෙම මෙවලම් සාර්ථක යැයි ඔබ සිතන්නේද? සුදුසු උදාහරණ සමඟ ඔබේ පිළිතුර පහදන්න.

2. "මැදිහත්කරුවෙකු (Mediator) යනු යුක්තිය පසිඳලන්නෙකු (Judge) හෝ බේරුම්කරුවෙකු (Arbitrator) නොවේ". මැදිහත්කරුවෙකුගේ භූමිකාවේ තිබිය යුතු මූලික ලක්ෂණ ඇසුරින් ඉහත ප්‍රකාශය අර්ථවත් ලෙස සාධාරණීයකරණය කරන්න.

3. කොටස් **දෙකටම (02)** පිළිතුරු සපයන්න.

   i. කෙටියෙන් මැදිහත්වීමේ ක්‍රමවේද (Intervention methods) දක්වන්න.

   ii. කොසෝවෝ ගැටුම (Kosovo Conflict) තුළදී මැදිහත්වීම් ක්‍රමවේද, ගැටුමෙහි විවිධ අවධීන් තුළදී ක්‍රමයෙන් භාවිතා වූ අයුරු විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න.

4. සමකාලීන සන්දර්භය තුළ ගැටුම් නිරාකරණ විෂයෙහි මතුව පවතින අභියෝගයන් පිළිබඳ විස්තරාත්මක රචනයක් ලියන්න.

5. සහමත්‍රණයේදී (Negotiation) භාවිතා කළ හැකි ප්‍රවේශයන් වන කේවල් කිරීම (Bargaining) සහ ගැටළු නිරාකරණය (Problem-solving) පිළිබඳව සංසන්දනය කරන්න.

6. ඕනෑම **දෙකකට (02)** කෙටි සටහන් ලියන්න

   i. ටෂ්කෙන්ට් ප්‍රඥප්තිය (Tashkent Declaration)

   ii. ජෝර්ජ් මිචෙල් (George Mitchell)

   iii. ඩේටෝන් ගිවිසුම (Dayton Accord)

   iv. කඩාකප්පල්කරුවන් (Spoilers)

****************